(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක **59**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 මැයි 09 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා**, වැඩබලන මුදල් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අජිත් මාන්නප්පෙරුම මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **පියසේන ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු තිලංග සුමතිපාල මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වසන්ත සේනානායක මහතා**

**ගරු මාවෙයි සෝ. සේනාධිරාජා මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු විජිත් විජයමුණි සොයිසා මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

**ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්, (40 අධිකාරය) මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2019 අප්‍රේල් 29 දිනැති අංක 2121/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වන ලදී.

එකියන ලද නියෝග **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පිළිගන්වා, එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්—

(i) 2017.06.06 සිට 2017.12.08 දක්වා කාලයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.02.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පළමුවැනි වාර්තාවේ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) 2017.06.06 සිට 2017.12.08 දක්වා කාලයට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019.02.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පළමුවැනි වාර්තාවේ මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් සඳහන් කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව

පිළිගන්වා, එම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා විසින්—

(i) 2018 වර්ෂය සඳහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව

පිළිගන්වා, එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) (i) ත්‍රිකුණාමලය, නුවර පාර, ආන්දම්කුලම්, අංක 1014/බී දරන ස්ථානයෙහි පදිංචි ඒ. එල්. අශෝක ශාන්ති කුමාර මහතාගෙන් ලැබුණු 2019.03.05 දිනැති පෙත්සම;

(ii) කන්තලේ, ත්‍රිකුණාමලය පාර, අංක 247/ බී දරන ස්ථානයෙහි පදිංචි බී. ඒ. මාලනී කුසුමලතා බාලසූරිය මහත්මියගෙන් ලැබුණු 2019.03.15 දිනැති පෙත්සම;

(iii) කොච්චිකඩේ, හලාවත පාර, අංක 162/4 යන ලිපිනයෙහි පදිංචි ඊ. ඒ. ආර්. ඒකනායක මහතාගෙන් ලැබුණු 2018.12.31 දිනැති පෙත්සම;

(iv) ඇඹිලිපිටිය, නව නගරය, හතරවැනි පටුමග, අංක 07 දරන ස්ථානයෙහි පදිංචි ජී. ජී. ප්‍රියානි ඩයස් ගුණසේකර මහත්මියගෙන් ලැබුණු 2019.03.13 දිනැති පෙත්සම;

(v) ත්‍රිකුණාමලය, ආන්දම්කුලම්, චම්පා මාවත, අංක 781 දරන ස්ථානයෙහි පදිංචි එම්. චන්දන උදය කුමාර මහතාගෙන් ලැබුණු 2019.03.01 දිනැති පෙත්සම; සහ

(vi) ත්‍රිකුණාමලය, නිලාවෙලි, කෝනේසපුරි යන ලිපිනයෙහි පදිංචි පොන්නසාමි ජයකුමාර් මහතාගෙන් ලැබුණු 2019.03.14 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) වාද්දුව, මාවල දකුණ, "සපුමල් උයන", අංක 258 දරන ස්ථානයෙහි පදිංචි පතිරණගේ ප්‍රියංකා කුමුදිනී මහත්මියගෙන් ලැබුණු 2018.03.17 දිනැති පෙත්සම ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) පන්නල, ඇලබඩගම, අත්කම් නිවාස, අංක 46 දරන ස්ථානයෙහි පදිංචි ඒ. බී. ෆරීඩ් මහතාගෙන් ලැබුණු 2018.12.17 දිනැති පෙත්සම;

(ii) වලල්ලාවිට, මගුරුමස්විල යන ලිපිනයෙහි පදිංචි එල්. ජී. තිස්ස මහතාගෙන් ලැබුණු 2019.01.21 දිනැති පෙත්සම; සහ

(iii) මතුගම, වැත්තෑව, නිවිතිගල පාර, සමනල උයන අසල, අංක 805 ඩී දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජී. නිමල් චන්ද්‍රසිරි රුද්‍රිගෝ මහතාගෙන් ලැබුණු 2019.01.06 දිනැති පෙත්සම

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1) :** වැඩබලන මුදල් අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජනවාරි 03 දිනැති අංක 2104/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(පූ.භා. 11.40 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.38 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි, ගරු වසන්ත සේනානායක මහතා, (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.18 ට ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

(අ.භා. 5.30 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 01 දිනැති අංක 2108/65 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 07 දිනැති අංක 2109/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 08 දිනැති අංක 2109/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 24 දිනැති අංක 2111/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6) :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 02 දිනැති අංක 2112/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. විදේශ විනිමය පනත යටතේ නියෝගය :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 පෙබරවාරි 28 දිනැති අංක 2112/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. රේගු ආඥා පනත යටතේ යෝජනාව :** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2019.03.29 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.
(2019 මාර්තු 05 දිනැති අංක 2113/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. කල් තැබීම (ශ්‍රී ලංකාවේ සියලු ජාතීන්ට පොදු නීති රාමුවක් සකස් කිරීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.51 ට, 2019 මැයි 10 වැනි සිකුරාදා පූ.භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.